# පදවි ශ්‍රී පුර ප්‍රාදේශීය සභාව

# ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය.

## 01. මූල්‍ය ප්‍රකාශන.

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 30 දින ද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2011 මැයි 05 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයෙ විගණකාධිපති වාර්තාව 2013 අප්‍රේල් 17 දින සභාවේ සභාපතිවරයා වෙත යවා ඇත.

### 1.2 මතය.

මාගේ පරික්ෂණයෙන් පෙනි යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව ,පදවි ශ්‍රී පුර ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් ,මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපැම හැර 2011 දෙසැම්බර් 31දිනට පදවි ශ්‍රී පුර ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිලිබද තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළබඳ අදහස් දැක්වීම.

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

(i) සභාව සතුව පවතින පරිගණකවල වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ii) වත්කම් විෂයයන් 09 ක් ස්ථාවර වත්කම් යටතේ දක්වා නොතිබූ අතර වත්කම් විෂයයන් 06 කවටිනාකම රු. 2,507,200 ක් විය.

(iii) මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ලී බඩු හා සවි කිරීම් ශේෂය හා ස්ථාවර වත්කම් උපලේඛනයේ දැක්වෙන ශේෂය අතර රු. 7,836 ක වෙනසක් නිරීක්ෂණය විය.

#### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම.

(අ) රු.300,000 වටිනා සථාවර තැන්පතු සහතික විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) සේවක ණය ලෙජරය 2011 දෙසැම්බර් 31 දිනට ශේෂකර නොතිබූ අතර රු. 1,738,600 ක් වූ සේවක ණය ශේෂයන් තහවුරු කර ගැනීමට අදාළ ලිපිගොනු විගණනයට ඉදිරිපත් නොකරන ලදී.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 186,388 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 689,530 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය.

වැය ශීර්ෂය 05 ප්‍රතිපාදන අවසන් වූ පසු නිසිපරිදි ප්‍රතිපාදන වෙන්කර ගැනීමකින් තොරව වියදම් දරා තිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පහත දැක්වේ.

| | | 2011 | | |
|---|---|---|---|---|
| | ආදායම් විෂය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 44 | 44 | - |
| (ii) | බදු කුලී | 385 | 360 | 96 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 178 | 198 | 36 |
| (iv) | වෙනත් ආදායම් | 2,127 | 2,270 | 254 |

### 2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------
**පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

(අ) (i) වර්ෂයකට වඩා වැඩි කාලයක් ගතවී තිබූ රු.128,219 අදාල ආදායම් ණයගැති ශේෂ 04 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) සභාව විසින් අත්තිකාරම් ලෙස ලබා උ ඇති රු.160, 653 ක අත්තිකාරම් මුදල් වර්ෂයකට වඩා වැඩි කාලයක් ගතවී ඇතත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) සභාව විසින් තැන්පතු ලේඛණයක් පවත්වා නොතිබුණි. එබැවින් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති විවිධ තැන්පතු රු. 849,792 ශේෂය සනාථ කර ගැනීමට නොහැකි විය.

**(ආ)** උතුරු නැගෙනහිර පළාත් සේවා ප්‍රවර්ධන ව්‍යාපෘතිය සඳහා (NELSIP) 2011 මැයි මාසයේ දී රු. 14,565,000 ක් ද , 2011 දෙසැම්බර් මාසයේ දී රු. 13,756,992 ක් ද වශයෙන් එකතුව රු. 28,321,992 ක මුදල් ලැබී තිබුණ ද 2011 දෙසැම්බර් 31 දිනට ද කිසිදු ඉදිකිරීම් කටයුත්තක් ආරම්භ කර නොමැති බව නිරීක්ෂණය විය.

**03.** **<u>පද්ධති හා පාලන.</u>**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය